


**මෙම සමාගමේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පී (විදුලි)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : අධීක්ෂණ නිළධාරින්ගේ උපදෙස් පරිදි කාර්යක්ෂමව හා අඛණ්ඩව සමස්ථ විදුලි බල සැපයුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම, නඩත්තු කිරීම හා සියළුම විදුලි උපකරණ, යන්ත්‍ර හා ගොඩනැගිලි වල විදුලි පද්ධති සැකසීම හා නඩත්තු කිරීම.

**රැකියාවේ වගකීම්** :

(I) මැනීමේ සහ පරීක්ෂා කිරීමේ උපකරණ විධිමත්ව භාවිතා කිරීම හා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම.

(II) විදුලි උපකරණ, මෙවලම් භාවිතය හා ඒවායේ ක්‍රියාකාරිත්වය හා නඩත්තුව පිළිබඳව මනා අවබෝධයක් ලබා තිබීම.

(III) විදුලි කාර්මිකයින්ගේ ලොග් සටහන් පොත් දිනපතා සම්පූර්ණ කිරීම.

(IV) ගොඩනැගිලි වල විදුලි පරිපථ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය නඩත්තු කටයුතු කිරීම.

(V) විදුලි කාර්මික වැඩ වල නිරතවීමේදී පුද්ගලයින්ට හා උපකරණ වලට සිදුවන අනතුරු වලක්වා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම ආරක්ෂිත විධිවිධාන අනුගමනය කිරීම.

(VI) විදුලි අර්බුද අවස්ථා වලදී ගුවන් තොටුපොලේ ක්‍රියාකාරිත්වය පවත්වා ගෙන යාම සඳහා සක්‍රිය ලෙස දායක වීම.

(VII) විටින් විට සිදුකළ යුතු පරීක්ෂා කිරීම් සැලැස්මට අනුව සිදු කිරීම.

02/-

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් විදුලි ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය. නැතහොත් දෑවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**පොදු කරුණු :-**
**ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.**

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකසා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට අදාළ සහතිකපත් වල ඡායා පිටපත්ද සමග ලියාපදිංචි තැපෑලෙන් පමණක් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.**

**පාඨමාලා සහතික, සේවා සහතික හා** අනෙකුත් සහතිකවල **ජායා පිටපත් හා ඉහත සඳහන් ආකාරයෙන් අයදුම්පත් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සියළුම අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2020 මාර්තු මස 16 වන දිනට පෙර ලැබීමට සලස්වන්න.**

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**